# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2157/33 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ සංශෝධිත පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: PLDS/LND/04/ACQ/92.

*අංකය*: 4-3/15/2017/VE/362.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ විස්තර :*

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවදුන් කෝරළේ උඩපත්තුව අංක 170 පනාවැන්න ග්‍රාම නිලධාරී වසමේ රත්නපුර මැනුම් අධිකාරී විසින් සාදන ලද අවසාන ගම් පිඹුරු 34, අතිරේක අංක 59, පත්‍ර අංක 56 කැබලි අංක 1198.

කැබලි අංක 1198 - ප්‍රමාණය හෙක්ටයාර් 13.3546 (හෙක්ටයාර් දහතුනයි දශම තුනයි පහයි හතරයි හයයි).

*උතුරට*: කැබලි අංක 71M; *නැගෙනහිරට*: කැබලි අංක 71M හා මාර්ගය (ප්‍රාදේශීය සභාව); *දකුණට*: මාර්ගය (ප්‍රාදේශීය සභාව) කැබලි අංක 71M, කැබලි අංක 107, කැබලි අංක 102, කැබලි අංක 71G; *බටහිරට*: කැබලි අංක 71M, කැබලි අංක 107, කැබලි අංක 102 හා කැබලි අංක 71G.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 මැයි මස 13 වැනි දින පෙ.ව. 10.00 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 මැයි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හෝ ඒ මුදල ගණනය කළ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එස්. ජී. රුවන්සිරි,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2020 ජනවාරි මස 08 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-596